**ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 හානි හා පාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල මු.රෙ. 109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති වාහන අනතුරු අලාභ වටිනාකම වූ රු. 352,050 ක අගයෙන් අයකරගත් රු.290,090 ක මුදල හා එහි කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය වූ රු.61,960 ක මුදල දෙපාර්තමේන්තුවේ හානි හා පාඩු ලේඛනයේ සටහන් කර නොතිබුණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර තිබුණු 2022 වර්ෂය තුළ සිදු වූ මු.රෙ 109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි රු.25,000/- ට වැඩි සිද්ධි සංඛ්‍යාව 1 යටතේ දක්වා ඇති රු.352,050/- ක අගය, වාහන සම්බන්ධ තොරතුරු ගොනුවක අමුණා ඇත. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛන නඩත්තු කළ යුතු වීම. |
| **(ආ)** | 2021 වර්ෂයේදී අංක WP CAD 7064 දරන රථයට සිදු වූ පාඩුවෙන් තවදුරටත් අයකර ගත යුතුව පැවති රු.20,792.59 ක මුදල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ඇමුණුම (i) හි තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ WP CAD 7064 රථයට සිදු වූ පාඩුවෙන් අයකර ගෙන නොතිබුණ රු.20,792.59 ක මුදල වාර්ෂික මූල්‍ය ප්‍රකාශයෙහි ආරම්භක කපා නොහල ශේෂය යටතේ දක්වා නොතිබීම හා එකඟ වන අතර ඉදිරියේදි නියමිත පරිදි සඳහන් කිරීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමේදී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ "සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය කිරීම" යන ප්‍රධාන අරමුණ ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබුණු ප්‍රධාන කාර්යයන් ආවරණය වන පරිදි අදාළ ක්‍රියාකාරකම් අන්තර්ගත කර තිබුණු බව විගණනයට නිරීක්ෂණය නොවීය. | විවිධ සාධකවල බලපෑම හේතුවෙන් රාජ්‍ය අංශයේ මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීම සඳහා අභියෝගාත්මක බලපෑමක් එල්ල කරන ලදී. එම තත්ත්වයන් හමුවේ දෙපාර්තමේන්තුව විසින් සිදුකල යුතු බවට හඳුනාගෙන තිබූ සියලු කාර්යයන් ආවරණය වන පරිදි සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සැබවින්ම අභියෝගයක් විය. | ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් ඇතුළත් කර විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු බව. |

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණයට අදාළ වාර්තා අනුව බඩු වට්ටෝරු පොතේ සටහන් තැබීමේ අඩුපාඩු පවතින බව හා දෙපාර්තමේන්තුව සතු වාහන, වාහන ලේඛනයේ ඇතුළත් නොකර බඩු වට්ටෝරු පොතෙහි ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී දෙපාර්තමේන්තුව මඟින් මෙම දුර්වලතා හඳුනාගත් අතර එම දුර්වලතා නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි 445 ප්‍රකාරව පොත්පත් හා ලේඛන නඩත්තු කළ යුතු වීම. |
| (ආ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කාර්තුමය කාර්ය මණ්ඩල තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂිකව අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම සඳහා මෙම වසරේ සිට පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සටහනක් යථා කාලයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තනතුරු 20 ක් පුරප්පාඩු වී තිබුණු අතර, ඉන් තනතුරු 13 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | අදහස් දක්වා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, එසේ නොවන තනතුරු තිබේ නම් ඒවා අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |